# අද තමයි මම මගේ මූණ දැක්කේ!



මිනුදි පූජාගොඩ

# අද තමයි මම මගේ මූණ දැක්කේ!

මිනුදි පූජාගොඩ

කතෘ

කතෘගේ වෙනත් කෘති

01.සෙනුරගේ කතාව

02.මේස පන්දු

03.ඒහෙම වෙන්නේ ඇයි

මහනුවර මහාමායා බාලිකා විදුහල

5 වසර සි

2026. 05.10 දිනය

ISBN 9786242112138

# පිදුම

මාගේ ආදරණීය

අම්මාටත්

අප්පච්චීටත්

සුරතල් නංගීටත්

සාදරයෙන්...........



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.


ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

කඳු අතරින් ගලා බසින සීතල දිය දහරාවලින් අලංකාර වූ වනරොද ඉතා රමණීයයි.තුරු මත හිඳ ගී ගායනා සියතුන්ගේ හඬ සිත නිවාලයි.



වනයේ වෙසෙන සිංහ රැල නිසා වනයට එක් වී ඇත්තේ අපූර්ව සුන්දරත්වයකි.

සිංහ රැලේ නායක සිංහයා ලිමස්ය. ඔහුගේ තේජාන්විත බව මුළු සිංහ රැලටම ආඩම්බරයකි.



සිංහ රැලේ සිටි අහිංසකම හා ලස්සනම සිංහධේනුව ලීනාය.ඇයගේ ලස්සන පරද්ද වන්නට තවත් සිංහධේනුවක් රැලේ සිටියේ නෑ .මේ පිළිබඳව විනස් සිංහධෙනුව තරහෙන් පසු විය.



සිංහ රැලේ සියලු දෙනාගේම ඉල්ලීම හා කැමැත්ත මත ලීමස් සහ ලීනා විවාහ විය.



ටික කලකින්ම ලීනා සිංහ පැටවකු බිහි කිරීමට සූදානම් විය. ඇය ගමන් ගත්තේ ද ඉතා අපහසු වෙනි. ලීමස් ඇයට අවශ්‍ය ආහාර ගුහාව අසලටම ගෙනවිත් දුන්නේය. දිනක් ලීමස් ගුහාවෙන් පිටතට ගිය අවස්ථාවේ ලීනා ඉතා සුරතල් සිංහ පැටවකු බිහි කළාය.



නමුත් අවාසනාවකට ටික දිනකින්ම ලීනා මිය ගියාය. ලීමස් ඉතා දුකට පත් වූ අතර ඉතා ආදරයෙන් තම පුතු හදා වඩා ගත්තේය ඔහුගේ නම සිවර්ය.නමුත් සිංහරාලේ ඉල්ලීමට අනුව ලීමස්ට නැවත විවාහ වීමට සිදුවිය. ඒ වීනස් සමගය..



ඒ වන විටත් වීනස්ට සිංහ පැටවකු සිටියේය. එම පැටියා ඉතා දුර්වල කෙසඟ පැටියෙකි ඔහු මුවර් නම් විය. එදා පටන් වීනස් සිවර්ට වෙනස්කම් කිරීමට පටන් ගත්තේය. නිතර නිතර සිවර්ට බැණ වැදුණේය.

සිවර් ඉතා කමකට නැති අදක්ෂ පැටවකු බවත් මුවර් ඉතා දක්ෂ පුෂ්ඨිමත් පැටවකු බවත් කියමින් නිතරම සිවර්ගේ සිත බිඳ දැමීය. සිවර්ද නිතර නිතර මේ කතා අසමින් ජීවත් වූ නිසා ඔහුද සිතා සිටියේ ඉතා දුර්වල කමකට නැති සිංහයෙකු කියාය.සිවර් උපන්

මොහොතේ මව මිය ගියේ සිවර්ගේ අපලයක් නිසා යැයි කියමින් වීනස් සිවර්ට ඇනුම් පද කීවේය. මුවර් ඉතා ශක්තිමත් තේජාන්විත සිංහ පැටයකු බවත් ඉතා වාසනාවන්ත බවත් නිතරම කියමින් සිවර්ගේ හිත බිඳ දැමුවේය

ලීමස් හට නිතර නිතර තම පුතු වන මුවර් රජකමට සුදුසු බව පවසමින් වීනස් ඇවිටිලි කළේය. නමුත් ලිමස් පවසා සිටියේ තම පුතා සිවර් රජකමේ නියම උරුමකරුකරු බවත් ඔහු රජකම ප්‍රතික්ෂේප කරන්නේ නම්

පමණක් එය මුවර්ට පැවරිය හැකි බවත්ය. වීනස්ගේ කතා නිසා සිවර් සිටියේ සිත් තැවුලෙනි. රජකමට තමා සුදුසු නැති බවත් තමා ඉතාම අදක්ෂ අවලස්සන බවත්ය.

නමුත් සත්‍ය එය නොවේ ශිවර් ඉතා තේජාන්විතය.නමුත් සිවර් තම රූපය දැක තිබුනේ නැත. එදා මහ වනයට තදින්ම වැසි වැටුණේය. මුළු වනයම සෝදා යමින් තිබුණි පසුදා උදෑසනම අවදි වූ සිවර්ට ඉතා තදින්ම පිපාසයක් දැනුනේය . ගුහාව අසල පොකුණ මඩවලින් පිරී තිබුණි

.දියබීම සඳහා වනයේ ඈතට ඇති නිල්දිය පොකුණට යාමට සිවර් සිතාගත්තේය. නිල්දිය පොකුණ ඉතා පිරිසිදුය.පොකුන අසලට ගිය සිවර් එයට එබී බැලීය. සිවර් ගැස්සී පිටුපසට විය. ජලය තුළ තේජාන්විත සිංහයෙකි. සිවර් නැවත ජලයට එබී බැලීය. ඒ තමාය. “අදයි මම මගේ මූණ දැක්කේ” සිවර් තමාටම කියාගත්තේය.

වීනස් තමන්ට බොරු පැවසීම නිසා තමාගේ ආත්ම ශක්තිය දුර්වල වී ඇති බව තේරුම් ගත් සිවර් ශක්තිමත්ව නැඟී සිටියේය.

මමයි රජා ඔහු පිය රජතුමා හමුවී ඒ තමා රජකම භාරගන්නා බව පැවසීමට සිවර් සිතාගත්තේය දුෂ්ට මිනිසුන්ගේ සෘණාත්මක අදහස් අප බින්දුවටම ඇද දමන බව අප උගත යුතු පාඩමකි

# පසු වදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)